සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(උ.පෙළ)විභාගය - 2021 (2022)

43- ක්‍රිස්තියානි ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



Department of Examinations - Sri Lanka

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

<u>එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය</u>

01. ක්‍රිස්තියානි ධර්මය I ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02 කි)

බහුවරණ ප්‍රශ්න 50 කි.

එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 50 කි.

02. ක්‍රිස්තියානි ධර්මය II ප්‍රශ්න පත්‍රය

(කාලය පැය 03 කි. අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.)

මෙය I කොටස සහ II කොටස වශයෙන් කොටස් දෙකකි.

<u>I කොටසට ප්‍රශ්න 03 කි</u>

- ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට අනු කොටස් 04 කි.
- අනු කොටස් I ලකුණු 02
  II ලකුණු 04
  III ලකුණු 06
  IV ලකුණු 08 අනු කොටස් හතරට ලකුණු 20

ප්‍රශ්න 02 ටම (2 x 20) ලකුණු 40 කි.

<u>II කොටසට ප්‍රශ්න 05 කි</u>

- ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට (i) සහ (ii) වශයෙන් කොටස් දෙකකි.
- (i) කොටසට ලකුණු 10 ක් ද,
- (ii) කොටසට ලකුණු 10 ක් ද, වශයෙන් එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.

ප්‍රශ්න තුනටම (3 x 20) ලකුණු 60 කි.

03. I පත්‍රය ලකුණු - 50

II පත්‍රය ලකුණු - 100 ÷ 2

I, II පත්‍ර සඳහා - 50 + 50

මුළු ලකුණු - <u>100</u>

Department of Examinations - Sri Lanka

උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..... √ △ $\frac{4}{5}$

(ii) ..... √ △ $\frac{3}{5}$

(iii) ..... √ △ $\frac{3}{5}$

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

43 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස** දැක්වෙන **උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. 'බයිබලය' යන පදය බිඳී එන ග්‍රීක වචනය කුමක්ද?
(1) වුල්ගාතා (2) තියෝ (3) නෙව්මා (4) බිබ්ලොස් (5) බිබ්ලියා

2. දාවිත්, සාවුල් රජතුමාගේ මාළිගයට පැමිණෙන්නේ,
(1) වීණා වාදනයට ය. (2) බටනලා වාදනයට ය.
(3) මද්දල වාදනයට ය. (4) සර්පිනා වාදනයට ය.
(5) සිතාර් වාදනයට ය.

3. ක්‍රිස්තු පූර්ව හත්වන සියවසේ අවසාන කාර්තුවේ දී බලවත් අධිරාජ්‍යය බවට පත්වූයේ,
(1) අසිරියාව ය. (2) බබිලෝනියාව ය. (3) ජුදයාව ය. (4) ජෙරුසලම ය. (5) ෂෙකෙම් ය.

4. 'භාෂා ශෛලිය කලාත්මක ය; සරල ය; සෘජු ය; උසස් හෙබ්‍රෙව් ය.' මෙම ලක්ෂණ සහිත දේවධාර්මික සම්ප්‍රදාය කුමක් ද?
(1) J (2) E (3) D (4) P (5) X

5. මැවීම පිළිබඳ පළමු කථාවෙහි 'පොළොව' යනු
(1) විශ්වයයි. (2) ස්වර්ගයයි. (3) භූමියයි. (4) සශ්‍රීකත්වයයි. (5) කාන්තාරයයි.

6. කානානිවරුන්ට අනුව සර්පයාගෙන් සංකේතවත් කළේ,
(1) විනාශයයි. (2) සාපයයි. (3) ප්‍රීතියයි. (4) වේදනාවයි. (5) සශ්‍රීකත්වයයි.

7. ආබ්‍රහම් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමට ප්‍රථම, දෙවියන් වහන්සේ ගිවිසුම් ඇතිකර ගත් පුද්ගලයින් කවුරුන් ද?
(1) ආදම්, කායින් (2) නෝවා, ආබෙල් (3) ආදම්, නෝවා
(4) කායින්, ආබෙල් (5) නෝවා, කායින්

8. ගුද්ධ බයිබලයේ පළමුවන ග්‍රන්ථයේ සඳහන් පරිදි ජාකොබ්තුමා දේවදූතයකු සමඟ පොරබැදූ ස්ථානය කුමක් ද?
(1) පෙනුයෙල් (2) බෙතෙල් (3) හෙබ්‍රොන් (4) බෙයර්ෂෙබා (5) මොරියා

9. ඉශ්‍රායෙල් ජනයාගේ මිදුම්කරු වූ මෝසෙස්තුමාගේ උපත හා හැදී වැඩීම තුළින් මනාව පිළිබිඹු වන්නේ දෙවියන් වහන්සේගේ
(1) උදාරත්වයයි. (2) මානව දයාවයි. (3) දිව්‍ය සංරක්ෂණයයි.
(4) කරුණාවයි. (5) දිව්‍ය ප්‍රේමයයි.

10. පාස්කු භෝජනය තුළ තිත්ත පළා අනුභවයෙන් සංකේතවත් කරන්නේ,
(1) දේව නියමය කඩිනමින් ඉටුකළ යුතු බවයි.
(2) පරාජය සැමරීමයි.
(3) දෙවියන් හා ඇතිකර ගත් ගිවිසුමයි.
(4) යුධ පරාජයයි.
(5) වහල්කමේ වූ අමිහිරි දුක්ගාවිනායි.

Department of Examinations - Sri Lanka

11. සීනයි ගිවිසුමෙන් ඉශ්‍රායෙල් ජනතාව ලද විශේෂ වරප්‍රසාද නිවැරදිව දක්වන වරණය තෝරන්න.

A - පූජක රාජ්‍යයක් වීම
B - කැප වූ (ශුද්ධ වූ) ජාතියක් වීම
C - දේශයක් හිමි වීම
D - දෙවියන් වහන්සේට ම අයිති සම්පත වීම
E - විශාල ධනයක් අයිති වීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා E (5) D හා E

12. "සියොන් පුරඟන ප්‍රීති ප්‍රමෝද වන්න." සෙකරියා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ 9 වන පරිච්ඡේදයේ මෙලෙස සඳහන් වන්නේ කවරකුගේ ආගමනය අරබයා ද?

(1) දාවිත් රජුගේ (2) දිවැසිවර යෙසායාගේ
(3) සාම කුමාරයාගේ (4) දිවැසිවර හොසෙයාගේ
(5) දිවැසිවර ජෙරමියාගේ

13. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - සමිඳාණන් වහන්සේ උසස් කළ සේක
B - සමාව දුන් සේක
C - මුදාගත් සේක
D - ස්ථාපිත කළ සේක

මින් ජෙරමියා යන්නෙහි අර්ථය සඳහන් ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා C ය. (5) C හා D ය.

14. ආමොස් දිවැසිවරයා හඳුන්වනු ලබන්නේ කවර දිවැසිවරයකු ලෙස ද?

(1) සමාජ සාමයේ (2) සමාජ සාධාරණත්වයේ (3) සමාජ ප්‍රේමයේ
(4) සමාජ කරුණාවේ (5) සමාජ අභිමානයේ

15. 'හොක්මා' (Hokmah) යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය කුමක් ද?

(1) බලාපොරොත්තුව (2) ප්‍රේමය (3) ප්‍රඥාව
(4) විශ්වාසය (5) බැහැපත්කම

16. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - සෑම පද්‍යයක් ම තත් සහිත වාද්‍ය භාණ්ඩයක් සමඟ ගයන ලද ඒවා ය.
B - සමහර ගීතිකා දුක, විලාපය හෝ මනස්තාපය හෝ ඇතිව ගයන ලද ඒවා ය.
C - බොහෝ ගීතිකා සතුටකින් හා ප්‍රශංසාවකින් ගයන ලද ඒවා ය.
D - සමහර ගීතිකා සංගීත භාණ්ඩයක් නොමැතිව ගායනා කළ ඒවා ය.
E - ඇතැම් ගීතිකා ශුද්ධ බයිබලයේ වෙනත් ග්‍රන්ථවලින් උපුටා ගත් ඒවා ය.

ගීතාවලිය ග්‍රන්ථය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

17. නව ගිවිසුමේ සඳහන් සමාජ රටා අනුව අයකැමියන් ජාතිද්‍රෝහීන් ලෙස සලකනු ලැබීමට හේතුව වූයේ,

(1) බදු අයකිරීමේ දී කෝපයෙන් කටයුතු කිරීමයි.
(2) ජනතාවට හිංසා පීඩා කිරීමයි.
(3) රජයට විරුද්ධව කටයුතු කිරීමයි.
(4) සිරිත් විරිත් ගරු නොකිරීමයි.
(5) රෝම අධිරාජ්‍යයට බදු එකතු කිරීමයි.

18. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - 'ශාදොක්' නැමැති පූජකයාගෙන් පැවත එති.
B - ගලීලයේ ජුදස් මොවුන්ගේ නිර්මාතෘවරයා විය.
C - විවාහ නොවීම මොවුන්ගේ ජීවිත පැවැත්මේ විශේෂිත විය.
D - මොවුහු ජුදා ආගමික බල ව්‍යුහයේ ආධිපත්‍යය හෙබවූහ.
E - දේවදූතයන් හා යක්ෂයන් පිළිබඳ විශ්වාස නොකළහ.

සද්දුසිවරු පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B හා E ය. (2) A, D හා E ය. (3) B, C හා D ය.
(4) B, C හා E ය. (5) C, D හා E ය.

Department of Examinations - Sri Lanka

19. සමදර්ශක සුභාරංචි ලෙස සලකනු ලබන්නේ,
(1) ශුද්ධ වූ මතෙව්, ක්‍රියාපොත හා ශුද්ධ වූ ජොහාන් ය.
(2) ශුද්ධ වූ මතෙව්, ශුද්ධ වූ මාර්ක් හා ශුද්ධ වූ ලූක් ය.
(3) ශුද්ධ වූ ලූක්, ශුද්ධ වූ මතෙව් හා ශුද්ධ වූ ජොහාන් ය.
(4) ශුද්ධ වූ ජොහාන්, ශුද්ධ වූ ලූක් හා ශුද්ධ වූ මාර්ක් ය.
(5) ශුද්ධ වූ මතෙව්, ශුද්ධ වූ මාර්ක් හා ක්‍රියාපොත ය.

20. 'මම වෙමි' යනුවෙන් ස්වයං අනාවරණ ප්‍රකාශන රැසක් ඉදිරිපත් කර ඇති නව ගිවිසුමේ ග්‍රන්ථය වන්නේ,
(1) ශුද්ධ වූ ජොහාන්තුමාගේ සුභාරංචිය ය. (2) එළිදරව් පොත ය.
(3) ශුද්ධ වූ මාර්ක්තුමාගේ සුභාරංචිය ය. (4) ශුද්ධ වූ මතෙව්තුමාගේ සුභාරංචිය ය.
(5) ක්‍රියාපොත ය.

21. සභාවට එක්වන විජාතීන් ගැලවීම ලැබීම සඳහා චර්මච්ඡේදන පිළිවෙත ඉටුකළ යුතු ද යන ගැටලුවට විසඳුම සපයන ලද මන්ත්‍රණ සභාව වන්නේ,
(1) එපීස ය. (2) නිසියානු ය. (3) ජෙරුසලම් ය. (4) කැල්සිඩොන් ය. (5) ත්‍රිදෙන්තිනු ය.

22. පාවුලුතුමාගේ 'අවසාන කැමැත්ත' ලෙස නම් කෙරෙන හසුන කුමක් ද?
(1) ගලාති (2) පිලිප්පි (3) එපීස (4) කොලොස්සි (5) 2 තිමෝති

23. ක්‍රිස්තුන් වහන්සේ විසින් යුගාන්තය පිළිබඳව ඉදිරිපත් කළ උපමා කතාවක් වන්නේ කුමක් ද?
(1) වපුරන්නා (2) අබ ඇටය
(3) අකීකරු පුත්‍රයා (4) යහපත් සමරිතානුවරයා
(5) යුවතියන් දස දෙනා

24. මෝසෙස්තුමාගේ දස පනතට නව අර්ථයක් දෙමින් ක්‍රිස්තුන් වහන්සේ විසින් ප්‍රතිපත්ති (භාග්‍ය) අටක් අඩංගු කර පවත්වන ලද්දේ,
(1) ධර්ම දූත සේවය පිළිබඳ දේශනය යි.
(2) යුගාන්තය පිළිබඳ දේශනය යි.
(3) උපමා පිළිබඳ දේශනය යි.
(4) කන්ද උඩ දේශනය යි.
(5) සභාවේ සාංඝිකත්වය පිළිබඳ දේශනය යි.

25. ශුද්ධ වූ පාවුලුතුමා 'වහලා' සඳහා භාවිත කරන ග්‍රීක් වචනය කුමක් ද?
(1) ඊසා (2) ලාමා (3) තලිතා (4) මිෂ්නා (5) ඩුලොස්

26. "ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක් නිසා ද දිළිඳුන් හට සුභ ආරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක..." . මෙසේ පැවසුයේ,
(1) ස්නාවක ජුවාමිතුමා විසින් බෞතිස්ම සිදු කරන අවස්ථාවේ දී ය.
(2) ජේසුස් වහන්සේගේ මංගල ධර්ම දේශනාවේ දී ය.
(3) ජෙරමියා දිවැසිවරයා විසින් දේශනයක් සිදුකරන අවස්ථාවේ දී ය.
(4) ජේදුරුතුමා විසින් පෙන්තකොස්ත දින දේශනාවේ දී ය.
(5) පාවුලුතුමා විසින් අන්තියෝකයේ දේශනාවේ දී ය.

27. ජෙරුසලම් සම්ප්‍රදාය අනුගමනය කරමින් තම සුභාරංචි රචනා කර ඇත්තේ,
(1) ශුද්ධ වූ පාවුලුතුමා හා ශුද්ධ වූ මාක්තුමා ය.
(2) ශුද්ධ වූ පාවුලුතුමා හා ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ මාක්තුමා හා ශුද්ධ වූ මතෙව්තුමා ය.
(4) ශුද්ධ වූ ලූක්තුමා හා ශුද්ධ වූ මතෙව්තුමා ය.
(5) ශුද්ධ වූ මතෙව්තුමා හා ශුද්ධ වූ ජොහන්තුමා ය.

28. ජේසුස් වහන්සේ විසින් 'නැවත ඉපදීම' පිළිබඳව කථා කිරීමේ දී එය ශාරීරික ඉපදීමක් ලෙස තේරුම් ගත් පුද්ගලයා වන්නේ,
(1) නිකදේමුස් ය. (2) අනනියස් ය.
(3) නිකොලොස් ය. (4) කොරනේලියස් ය.
(5) ප්‍රොකොරොස් ය.

Department of Examinations Sri Lanka

29. කොන්සල්වරයකු සහ කිතුනුවකු වූ ෆ්ලේවියස් ක්ලෙමන්ස් මරා දමා ෆ්ලේවියා ඩොමිටිල්ලා රටින් පිටුවහල් කිරීමට ක්‍රියා කළේ,
(1) ඩෙසියස් අධිරාජයා ය.
(2) ට්‍රාජන් අධිරාජයා ය.
(3) මැක්සිමිනස් අධිරාජයා ය.
(4) ඩොමිෂියන් අධිරාජයා ය.
(5) මාකස් අවුරේලියස් අධිරාජයා ය.

30. ශුද්ධ වූ ජෙරෝම්තුමා පූජකවරය ලබා කොන්ස්තන්තිනෝපලයට පැමිණ ශුද්ධ ලියවිල්ල හැදෑරුවේ කවුරුන් යටතේ ද?
(1) නසියන්ස් හි ග්‍රෙගරිතුමා
(2) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ සිරිල්තුමා
(3) ශුද්ධ වූ ජස්ටින්තුමා
(4) ශුද්ධ වූ අගොස්තීන්තුමා
(5) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ අතනාසියස්තුමා

31. ඔරිජන්තුමාගේ මූලික සිද්ධාන්ත වැනි කෘති ලතින් භාෂාවට පරිවර්තනය කරන ලද්දේ,
(1) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ සිරිල්තුමා ය.
(2) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.
(3) ශුද්ධ වූ අගොස්තීනුතුමා ය.
(4) ශුද්ධ වූ ජෙරෝම්තුමා ය.
(5) ටර්ටුලියන්තුමා ය.

32. 21 වන මන්ත්‍රණ සභාව ලෙස සලකන්නේ,
(1) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවයි.
(2) නිසියානු මන්ත්‍රණ සභාවයි.
(3) එපීස මන්ත්‍රණ සභාවයි.
(4) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවයි.
(5) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවයි.

33. මුල් යුගයේ දී මන්ත්‍රණ සභා කැඳවීමට ප්‍රධාන හේතුවක් වූයේ,
(1) රාජ්‍ය පාලනය පිළිබඳ තීරණ ගැනීමට ය.
(2) සභා නායකයන් ලෙස රජවරු පත් කිරීමට ය.
(3) වේද භේදික මතවල වැරදි පෙන්වා දීමට ය.
(4) ගිහි ධර්මදූත සේවාව පිළිබඳව තීරණ ගැනීමට ය.
(5) රාජ්‍යයන් සඳහා වන බදු ක්‍රම හඳුන්වා දීමට ය.

34. 'පියාණන් සමඟ එකම භවත්වය ඇතිව' යන සංකල්පය ශුද්ධ වූ සභාවේ වේද සත්‍යතාවක් බවට පත් කළේ,
(1) නිසියානු මන්ත්‍රණ සභාවෙන් ය.
(2) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවෙන් ය.
(3) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් ය.
(4) කැල්සිඩොන් මන්ත්‍රණ සභාවෙන් ය.
(5) එපීස මන්ත්‍රණ සභාවෙන් ය.

35. එව්ටිකස්ගේ ප්‍රකාශන වේද භේදික බව පෙන්වා දුන්නේ,
(1) නසියන්ස් හි ග්‍රෙගරිතුමා ය.
(2) කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ෆ්ලේවියන්තුමා ය.
(3) නිකොමේඩියාවේ රදගුරු එව්සේබියස්තුමා ය.
(4) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්තුමා ය.
(5) මිලාන් හි රදගුරු අම්බ්‍රෝස්තුමා ය.

36. ශුද්ධ බයිබලයේ සඳහන් **නොවන** සෑම ඇදහිල්ලක්ම ප්‍රතික්ෂේප කළේ,
(1) මාටින් ලූතර්තුමා ය.
(2) පෙලාජියස්තුමා ය.
(3) ජෝන් වෙස්ලිතුමා ය.
(4) ජෝන් කැල්වින්තුමා ය.
(5) චාල්ස් වෙස්ලිතුමා ය.

37. හත්වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා විසින් ප්‍රතික්ෂේප කරන ලද එංගලන්තයේ අටවන හෙන්රි රජතුමාගේ ඉල්ලීම කුමක් ද?
(1) රෝමයට පැමිණීම
(2) ප්‍රසාදස්තාපනය
(3) ඔහුට ඔටුනු පැළඳවීම
(4) දික්කසාද වීම
(5) ශුද්ධෝත්තම පියතුමා එංගලන්තයට පැමිණීම

Department of Examinations - Sri Lanka

38. ආර්ථික අවපාතයට ගොදුරු වූ පතල් කම්කරුවන් හා ගැමි ජනතාව ආධ්‍යාත්මිකව පෝෂණය කිරීමට මහත් වෙහෙසක් දරණ ලද පුද්ගලයා/ පුද්ගලයන් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

A - ලොයෙලාහි ඉග්නේෂස්තුමා
B - මාටින් ලූතර්තුමා
C - ජෝන් වෙස්ලිතුමා
D - චාල්ස් වෙස්ලිතුමා
E - විලියම් බූත්තුමා

(1) A (2) B (3) A හා B (4) B හා E (5) C හා D

39. ත්‍රිදෙන්තිනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘතියක් වන්නේ,
(1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට උනන්දු කිරීමයි.
(2) භාරහාර වීමට උනන්දු කිරීමයි.
(3) පාද නමස්කාරය කිරීමට උනන්දු කිරීමයි.
(4) වන්දනා ගමන් යාමට උනන්දු කිරීමයි.
(5) දාන ධර්ම දීමට උනන්දු කිරීමයි.

40. XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා විසින් සමාජ සාධාරණත්වය පිළිබඳව ලියන ලද විශ්ව ලේඛනය කුමක් ද?
(1) මාටර් එට් මජිස්ට්‍රා - මව හා ගුරුවරිය
(2) පාචෙම් ඉන් ටෙරිස් - ලෝක සාමය
(3) ඩේඋස් කරිටාස් එස්ට් - දෙවියන් වහන්සේ ප්‍රේමයයි
(4) රේරුම් නොවාරුම් - වෙහෙසෙන මිනිස්සු
(5) කරිටාස් ඉන් වෙරිටාටෙ - සත්‍ය තුළ දයාව

41. "කිසියම් කෙනෙකු තම මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකි ය." මෙය ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
(1) ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
(2) ගරු ක්ලෙමන්ට් ද සූසා පියතුමා
(3) ගරු ජුසේ වාස් පියතුමා
(4) ගරු මයිකල් රුදිගු පියතුමා
(5) ගරු ෆ්‍රැන්සිස් සේවියර් පියතුමා

42. පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂියක් වන්නේ,
(1) නුවරින් හමු වූ පූජා ඇඳුම් ය.
(2) අනුරාධපුරයෙන් හමු වූ ගල් කුරුසිය ය.
(3) පුත්තලමෙන් හමු වූ සොහොන් බිම ය.
(4) අම්පිටියෙන් හමු වූ සිරි සලුව ය.
(5) මාතරින් හමු වූ දේවමාතා ප්‍රතිමාව ය.

43. 'ස්කොලාකල් කොමිසම' නැමති විශේෂ ආයතනය මඟින් පාසල්වලට ගුරුවරුන් පත් කිරීම, පාලනය කිරීම, පාසල් නිරීක්ෂණය සිදු වූයේ,
(1) පෘතුගීසි පාලන සමයේ දී ය. (2) ලන්දේසි පාලන සමයේ දී ය.
(3) ඉංග්‍රීසි පාලන සමයේ දී ය. (4) නිදහස් පාලන සමයේ දී ය.
(5) සිංහල රජවරුන්ගේ පාලන සමයේ දී ය.

44. 'ආනන්ද කලිප්පුව' නැමති පද්‍ය කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා
(2) ගරු ජුසේවාස් පියතුමා
(3) ගරු ජෝශප් මේරි බ්‍රාවි පියතුමා
(4) ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
(5) ගරු මරියා ද මිරන්ඩා පියතුමා

45. ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්තියක් වන්නේ,
(1) විදේශීය ආධාර ලබා ගැනීමයි.
(2) රෝමයෙන් මිෂනාරිවරුන් ගෙන්වා ගැනීමයි.
(3) ලතින් භාෂාව පමණක් ප්‍රචලිත කිරීමයි.
(4) වන්දනා ගමන් සංවිධානය කිරීමයි.
(5) ධර්මදූත කාර්යය සඳහා ගිහි නායකයන් පත් කිරීමයි.

Department of Examinations - Sri Lanka

46. ශුද්ධ වූ සභාවේ අනිවාර්ය/ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) භක්තියයි.
(2) දේශානුකරණයයි.
(3) වන්දනාවයි.
(4) ශුද්ධත්වයයි.
(5) කීර්තියයි.

47. ක්‍රි.ව. 4 වන සියවසේ කිතුනුවන්ට නිදහස් යුගයක් උදාවූයේ කුමක් මඟින් ද?
(1) එපීස මන්ත්‍රණ සභාව
(2) නිසියානු මන්ත්‍රණ සභාව
(3) රෝම ආඥාව
(4) ලීමා ආඥාව
(5) මිලාන් ආඥාව

48. ක්‍රි.ව. 1956 දී නිකුත් වූ බෞද්ධ කොමිසමේ වාර්තාව අනුව ශ්‍රී ලාංකීය රජය විසින් සේවයෙන් ඉවත් වන ලෙස අණ කරන ලද්දේ,
(1) රජයේ පාසල් සේවයේ නියුතු පූජකතුමන්ලාට ය.
(2) රජයේ රෝහල් සේවයේ නියුතු පැවිදි සොයුරියන්ට ය.
(3) පාසල්වල සිටි කතෝලික ගුරුභවතුන්ට ය.
(4) සමාජ සුභසාධනයේ යෙදෙන්නන්ට ය.
(5) ගුරු විද්‍යාලවල සිටි කතෝලික පූජකතුමන්ලාට ය.

49. සභා ජීවිතය හා විශ්වාසය සම්බන්ධව එකඟවීම් මෙන්ම වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද ලියවිල්ල හඳුන්වනු ලබන්නේ,
(1) මානව සංවර්ධන ලේඛනය යනුවෙනි.
(2) විමර්ශන වාර්තාව යනුවෙනි.
(3) මැග්නා කාර්තා ලේඛනය යනුවෙනි.
(4) ලීමා ලේඛනය යනුවෙනි.
(5) අන්තර් නිකායික මිත්‍රශීලී ලේඛනය යනුවෙනි.

50. මනුෂ්‍යයා ස්වභාවයෙන්ම සමාජීය වන හෙයින් අනුන් සමඟ එකතු වී එකිනෙකාගේ සුභසිද්ධිය සඳහා වැඩ කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙමින් අති උතුම් 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා නිකුත් කළ විශ්ව ලේඛනය කුමක් ද?
(1) වෙහෙසෙන මිනිස්සු
(2) විශ්වාසයේ අභිරහස
(3) ලෝක සාමය
(4) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව
(5) අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහය

***

Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம் : 43

විෂයය / பாடம் : ක්‍රිස්තියානි ධර්මය

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.
01.	4	11.	1	21.	3	31.	4	41.	3
02.	1	12.	3	22.	5	32.	5	42.	2
03.	2	13.	3	23.	5	33.	3	43.	2
04.	2	14.	2	24.	4	34.	1	44.	4
05.	1	15.	3	25.	5	35.	2	45.	5
06.	5	16.	1	26.	2	36.	4	46.	4
07.	3	17.	5	27.	3	37.	4	47.	5
08.	1	18.	2	28.	1	38.	5	48.	2
09.	3	19.	2	29.	4	39.	1	49.	4
10.	5	20.	1	30.	1	40.	4	50.	3

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

Department of Examinations - Sri Lanka

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

ලකුණු දීමේ පටිපාටිය

II පත්‍රය

1. (i) පැරණි දිවැසිවරු කළ කී දෑ සඳහන් වන ශුද්ධ වූ බයිබලයේ ග්‍රන්ථ **දෙක** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) දිවැසිවර ඉගැන්වීමෙහි ප්‍රධාන තේමා **දෙකක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) යෙසායා දිවැසිවරයාට අනුව මෙසියස් වහන්සේගේ සුලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ආමොස් දිවැසිවරයාගේ ජීවිතාදර්ශය අද සමාජය තුළ ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

(i) • සාමුවෙල් ග්‍රන්ථ (I,II)

• රාජාවලිය ග්‍රන්ථ (I,II)

(ලකුණු 1 X 2 = 2යි)

(ii) • ඒක දේව වාදය

• සදාචාරය

• මෙසියාන සංකල්පය

(ලකුණු 2 X 2 = 4යි)

(iii) • **අසිරිමත් උපදේශකයාණෝ ය.**

දෙවියන් වහන්සේ වෙතින් උපදෙස් ලබන මෙතුමා මිනිස් ප්‍රඥාව මත පමණක් විශ්වාසය නොතබන බැවින් මිනිසාට මඟ පෙන්වීමක් කළ හැකි දේව ප්‍රඥාවෙන් පූර්ණ උත්තමයෙකි.

• **ප්‍රතාපවත් දෙවි තුමාණෝ ය.**

පුරාතනයේ රජවරුන් සතු පරමාධිපත්‍ය පෙන්වීමට මෙම නාමයෙන් ආමන්ත්‍රණය කරනු ලැබීය. පසුකාලීනව මෙමගින් දේව අධිකාරීත්වය හඟවනු ලැබිණි. මෙසියස් වහන්සේ දේව ආධිකාරි බලයෙන් සන්නද්ධ බව මින් ප්‍රකාශ වේ.

• **සදාතන පියාණෝ**

මෙය දේව නාමයකි; මෙසියානික රාජ්‍යයේ සදාතන බව මින් ඉස්මතු කරයි. පුරාතනයේ දී රජතුමා තම රාජ්‍යයේ ජනතාවගේ පියා විය. සදාතන රාජ්‍යයේ සදාතන පියාණන් වූයේ මෙසියස් වහන්සේ ය.

Department of Examinations - Sri Lanka

- **සාමයේ කුමාරයාණෝය**

එතුමාගේ රාජ්‍යය සාමය තුළ ජනතාවගේ සාධාරණ බලාපොරොත්තු හා අපේක්ෂාවන් ඉටු වීම මගින් අත්දකින සතුට, ආත්ම තෘප්තිය හා සංහිඳියාව මෙයින් ප්‍රකාශ වේ. මෙසියස් වහන්සේගේ ආගමනය මගින් එය ඉටු වන්නේය.

මෙසියස් වහන්සේ දාවිත් රාජ වංශයේ පෙළපත් උරුමය ලබන බවත්, සදාතන සාමයක් වැඩි වර්ධනය වන බවත්, පවසන දිවැසිවරයා, එවන් තිරසාර වූ සාමයක් ඇති රාජ්‍යයක් ඇති කරන්නට එතුමාණන් යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන බවත් පැහැදිලි කරයි.

(ලකුණු 2 x 3= 6යි)

(iv.)

- ආමොස් දිවැසිවරයා මෙන් නිරතුරුව දේව හඬට සවන් දෙමින් කැඳවීමට ප්‍රතිචාර දක්වමින් පැවරෙන දූත කාර්යය නිසි ලෙස ඉටු කිරීම.
- අයුක්තිය අසාධාරණය වෙනුවෙන් නිරතුරුව ඉදිරිපත් වී වැඩ කටයුතු කළාක් මෙන් අද සමාජය තුළ ක්‍රියා ක්‍රියාකිරීමේදී යුක්තිය සාධාරණත්වය වෙනුවෙන් ඇපකැප වී ක්‍රියා කිරීම.
- ආමොස් දිවැසිවරයා එදා පැවැති පන්ති භේදය දුගී දුප්පත්කම සමාජයෙන් තුරන් කිරීමට කටයුතු කළාක් මෙන් අද සමාජයේ දක්නට ලැබෙන පන්ති පරතරය ඇති නැති පරතරය නැති කිරීමට ඉදිරිපත් වී කටයුතු කිරීම.
- සැඟවුණු අසාධාරණය වෙනුවෙන් නිරතුරුව දැඩි ලෙස කතා කරමින් ක්‍රියා කළාක්, මෙන් අද සමාජය තුළ ඇති සැඟවුණු අසාධාරණය ඉදිරියේ සාධාරණත්වය වෙනුවෙන් මැදිහත් වී ක්‍රියා කිරීම.
- ආර්ථික අසමානතා දැඩි ලෙස හෙළා දකිමින් ආමොස් දිවැසිවරයා ක්‍රියා කළාක් මෙන් සමාජය තුළ ඇති දුෂ්කරතා මැඩ පැවැත්වීමට ක්‍රියා කිරීම. ඔවුන් වෙනුවෙන් හැකි අයුරින් උදව් උපකාර කිරීම.
- ආමොස් දිවැසිවරයා නිරතුරුවම සත්‍යයට සාක්ෂි දරමින් සමාජයේ ක්‍රියා කළාක් මෙන් සමාජයේ අසත්‍ය රජයන අවස්ථාවලදී සත්‍යයට සාක්ෂි දැරීම.

(මෙවැනි කරුණු 4ක් ලියා ඇත්නම් ලකුණු 2 x 4= 8යි)

2. (i) ශුද්ධ වූ පාවුලුතුමාගේ තෙවන ධර්මදූත චාරිකාවේ අරමුණු **දෙක** ලියන්න. (ලකුණු 02යි)

(ii) ශුද්ධ වූ පාවුලුතුමා එපීසවරුන්ට ලියූ හසුනේ අරමුණු **දෙක** ලියා දක්වන්න. (ලකුණු 04යි)

(iii) ශුද්ධ වූ පාවුලුතුමා තෙසලෝනිකවරුන්ට ලියන ලද ප්‍රථම හසුනේ ඇතුළත් වන විශේෂ කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 06යි)

(iv) ශුද්ධ වූ පාවුලුතුමා සිය සන්දේශ මඟින් කිතුනුවන් මෙන්ම කිතුනු සභාව වර්ධනයට දැරූ උත්සහය මෙන්, ඔබ කිතුනු සභාවේ දියුණුව සඳහා ක්‍රියා කරන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

Department of Examinations - Sri Lanka

(i.)

- ස්ථාපිත කළ සභාවන්හි වර්ධනය විමසීම.
- එම සභා සාමාජිකයින් දිරිමත් කිරීම.

(ලකුණු 1 x 2 = 2යි)

(ii.)

- සියලු දේව ධාර්මික ඉගැන්වීම් තුළ සභා සවිමත් කරමින් අධ්‍යාත්මිකත්වය රැක ගැනීම සඳහා සතු වගකීමක් බව පෙන්වාදීම.
- කිතුනු සභා දිවියේ ඒකත්වයේ පදනම ද ශීල ධාර්මික වටිනාකම් මගින් උදාවන නවෝදය ගැන ද ගැඹුරු ඉගැන්වීමක් ඉදිරිපත් කෙරේ.

(ලකුණු 2 x 2 = 4යි)

(iii.)

- කිතුනු පැවැත්ම බලාපොරොත්තුවේ ජීවිතයකි.
- ක්‍රිස්තුන් වහන්සේ සමග එකමුතුව උන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ වෙතට යා යුතුයි. ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය අපේක්ෂාවෙන් සිටිය යුතුය.
- ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය හදිසියෙන් සිදුවිය හැකිය.

(ලකුණු 2 x 3 = 6යි)

(iv.)

- දෙවියන් වහන්සේ මට ලබා දී ඇති දීමනාවන් උන් වහන්සේගේ රාජ්‍යය පතල කිරීම ට යොදා ගැනීම.
- අන් අයගේ අවශ්‍යතා සොයා බලා තම කාලය හා ශ්‍රමය වැය කරමින් ඇප කැප වී කටයුතු කිරීම.
- විශේෂයෙන් ලේඛන හැකියාව ඇත්නම් ශුද්ධ වූ පාවුලු තුමා මෙන් දේව වචනය ව්‍යාප්ත කිරීමට යොදා ගැනීම.
- දෙවියන් වහන්සේගේ දයා කරුණාව ප්‍රකාශ කිරීම තුළින් කිතුනු සභා එකමුතුව සඳහා කටයුතු කිරීම.
- පාසල, මීසම, සමාජය තුළ කිතුනු නායකත්වය ගෙන පාවුලු තුමා මෙන් කටයුතු කිරීම, සාක්ෂි දැරීම.
- අපට පැමිණෙන බාධක අභියෝග ඉදිරියේ නොපසුබටව තම කාර්යයන් ඉදිරියට කරගෙන යැම.

(ලකුණු 2 x 4 = 8යි)

Department of Examinations - Sri Lanka

3. (i) පස්වන සියවසේ දී බටහිර අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල බලය අල්ලාගත් ගෝත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ක්ලුනි තාපස නිකායේ ප්‍රතිසංස්කරණවලින් අනතුරුව බිහි වූ තාපස ක්‍රම **දෙක** හා ඒවා ආරම්භ කළ පුද්ගලයන් නම් කරන්න. (ලකුණු 04යි)

(iii) 23 වන ශුද්ධ වූ ජුවාම් ශුද්ධෝත්තම පියතුමා සිදු කළ සේවාවන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රධාන අරමුණු **හතරක්** ලියා, ඒ අනුව ඔබ අද සමාජය තුළ ක්‍රියා කරන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

(i)

- හන්ස් ගෝත්‍රය
- වැන්ඩල් ගෝත්‍රය
- විසිගොත් ගෝත්‍රය

(මින් දෙකක් ලියා තිබිය යුතුය.)

(ලකුණු 1 x 2 = 2යි)

(ii)

- කැමල්ඩොලෙස් තාපස ක්‍රමය - ශුද්ධ වූ රොමෝල්ඩ් මුනිතුමා
- කාර්තුෂියන් තාපස ක්‍රමය - ශුද්ධ වූ බෘනෝ මුනිතුමා (බ්‍රෑ මුනිතුමා)

(ලකුණු 2 x 2 = 4යි)

(iii)

- කිතුනු ඒකත්වය සඳහා ස්වාධීන ලේකම් කාර්යාලයයක් ඇති කළේ ය. එම සංගමයේ පෙරමුණ ගෙන කටයුතු කළේ ය.
- සාකච්ඡා ප්‍රතිපත්ති මඟින් ප්‍රතිසංස්කරණ සහා හා ශුද්ධ වූ සභාව අතරේ පැවති අර්බුද සමථයකට පත් කළේ ය.
- ලෝක සාමය වෙනුවෙන් කටයුතු කිරීම - 'ලෝක සාමය' විශ්ව ලේඛනය මගින්
- මිනිස්කමට ගරු කරමින් දිළින්දන් හා ධනවතුන් අතර උස් පහත් භේදය තුරන් කිරීමට කටයුතු කිරීම - 'මව හා ගුරුවරිය' විශ්ව ලේඛනය මගින්

(ලකුණු 2x3=6යි)

(iv)

- විශ්වාසයට හා ශීලධර්මයට විරුද්ධව පැන නැගී ඇති දුර්මත දුරු කිරීම.
- පරිවර්තන යුගයකට ගැළපෙන ලෙස විනය කරුණු සකස් කිරීම.
- කතෝලික සභාවේ තත්වය හා ස්වභාවය සවිස්තරව විග්‍රහ කිරීම.
- රාජ්‍යන් සමග ශුද්ධවූ සභාවේ සම්බන්ධතා පහදා දීම.

මෙවැනි කරුණු 4ක් ලියා පැහැදිලි කර ඇත්නම් (ලකුණු 2x4=8යි)

Department of Examinations - Sri Lanka

ඉගෙනුම් ඵල :

★ ශුද්ධ බයිබලය දේව වචනය බවත් අප ගරුත්වයෙන් එය භාවිතා කළ යුතු බවත් පිළිගනියි.

4. (i) දේවානුභාවය යනු කුමක් දැයි අර්ථ කථනය කර දේවානුභාවයේ ප්‍රභේද තුන විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) දේවානුභාවයෙන් ලේඛන ගත කරන ලද ශුද්ධ වූ ලියවිල්ල එදිනෙදා ජීවිතයේ දී ඔබ ප්‍රයෝජනයට ගන්නා අවස්ථා පහක් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(i.) දේවානුභාවය සඳහා යෙදෙන ග්‍රීක වචනය 'තියෝනෙව්ටෝස් 'ය.

'තියෝ' යනු දෙවියන් වහන්සේ වන අතර 'නෙව්මා' යනු හුස්මය.

- ඒ අනුව තියෝනෙව්ටෝස් යනු දෙවියන් වහන්සේ විසින් හුස්ම හෙළන ලද යන්නය.
- එනම් යමකට දෙවියන් වහන්සේ හුස්ම හෙළන්නේද එය සම්පූර්ණයෙන්ම වෙනස් වනු ඇත.
- දේව වචනය ග්‍රන්ථාරූඪ කරන අවස්ථාවේදී එම මිනිස් කතුවරුන් මත දේව හුස්ම හෙළීම නිසා ලියන ලද දෙය අද්විතීය කාර්යයක් බවට පත්විය.
- ඒ අනුව එම වෙනස් වීම සිදුවූයේ මිනිස් කතුවරයා එම කාර්යයේ නියැලෙන විට ඔහුගේ මනස තුළ ශුද්ධාත්වරයාණන් වහන්සේ විනිවිද ගමන් කිරීම නිසාය.
- ඒ අනුව මුළු ශුද්ධ ලියවිල්ලම දේවානුභාවයෙන් ලියවී ඇත.

(ලකුණු 4යි)

1. එඩේරික දේවානුභාවය

පුද්ගලයකු ක්‍රියා කිරීමට (නායකත්වය දැරීමට) ලබන දේවානුභාවයයි.

දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනනායකයින් මෙම දේවානුභාවය ලැබීය. ඔවුන් මත දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලැබීමක් ලෙස මෙම උදාහරණ දැක්විය හැකිය (වීරාවලිය 14:19 - සැම්සන්, 1 සාමුවෙල් 16:13 - දාවිත්, යෙසායා 63:11 -මොසෙස් තුමා, යෙසායා 11:2, 61:1, ලූක් 4:18-19 - මෙසියස් වහන්සේ)

2. දෙසීම සඳහා වූ දේවානුභාවය (වාචික)

දේව පණිවිඩය ප්‍රකාශ කිරීම සඳහා දානය කරන දේවානුභාවය මේ නමින් හැඳින් වේ. මෙම දේවානුභාවය ලැබුවේ දිවැසිවරු, ජේසුස් වහන්සේ, අපෝස්තුලුවරුන්ටය.
(2 පේදුරු 1:21, ලූක් 4:18, 12:11-12)

3. ලිවීම සඳහා වූ දේවානුභාවය (ලිඛිත දේවානුභාවය)

ලිවීම සඳහා දෙවිඳුන් ගෙන් අණක් ලැබීම මින් හගවයි. එසේ අණ ලැබුවේ දිවැසිවර යෙසායා 38:8, ජෙරමියා 30:2) දේව වචනය ලේඛන ගත කිරීම සඳහා ලැබුණු දේවානුභාවය ලිඛිත දේවානුභාවය ලෙස හඳුන්වනු ලැබේ.

(ලකුණු 2 x 3 = 6යි)

Department of Examinations - Sri Lanka

(ii.)

- ප්‍රසන්න කිතුනු දරුවෙකු ලෙස ජීවත්වීමට මග පෙන්වීම සඳහා දිනපතා ශුද්ධ ලියවිල්ල කියවීම.
- ජීවිතයේ විවිධ අවස්ථාවලදී මුහුණ දෙන අභියෝග හා කටුක අත්දැකීම්වලට සාර්ථකව මුහුණදීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා ගැනීම
- ලොව පුරා පැතිර යන විවිධ වසංගත උවදුරු වලදී දේව සංරක්ෂණය තුළ රැඳීමට හා ශක්තිමත් වීමට උපකාරී වේ
- සත්‍ය වූ සදාතනික වූ නිවැරදි ඉගැන්වීම් අනාවරණය කර ගැනීමට ශුද්ධ ලියවිල්ල අධ්‍යනය කිරීම (බයිබල් පාඨමාලා වලට සම්බන්ධ වීම)
- මූලධර්මවාදී ඉගැන්වීම් අභියස සාර්ථකව ඊට මුහුණදීමට ශුද්ධ ලියවිල්ල ප්‍රයෝජනයට ගැනීම.
- දිනෙන් දින වෙනස්වන නව තාක්ෂණික යුගයක ජීවත්වන විට ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව ජීවත්වීමට මඟ පෙන්වීම.
- දේව විශ්වාසය වර්ධනය කරගෙන ජීවත්වීමට ශුද්ධ ලියවිල්ල මඟ පෙන්වීම.

(මෙවැනි අවස්ථා 5 ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 10 යි)

ඉගෙනුම් ඵල :

★ **දස පනතේ මඟ පෙන්වීම් ඔස්සේ සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි.**

5. (i) ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා යන ගමනේ දී ලැබූ දස පනතෙහි ලක්ෂණ පහක් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) සාරධර්මවලින් පෝෂිත ජීවිතයක් ගත කිරීම සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබට දස පනත යොදාගත හැකි ආකාරය පනත් පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(i)

1. <u>විධායක නීති පද්ධතියකි</u>

දස පනතෙහි මූලික වශයෙන් විධායක නීති ඇත. නිදසුන් ලෙස නික්මයාම 20:3, 13-18. පැරණි ගිවිසුම තුළ නීතිය විධායක හා අසම්භාව්‍යය ලෙස වර්ග කර තිබිණි. විධායක නීති සාමාන්‍යයෙන් කෙටි, ඍණාත්මක හා මධ්‍යම පුරුෂ ඒක වචනයෙන් ඉදිරිපත් කරයි. තවද වාචික සම්ප්‍රදායේදී දස පනත මුලු මනින්ම විධායක ස්වරූපයක් ගත් බවට සාක්ෂි ඇත.

2. <u>නිෂේධනාත්මක නීති</u>

නිෂේධනාත්මක යනු "නොකළ යුතුය" යන්නයි. ද්විතීය නීති සංග්‍රහයේ 5:7-21 අනුව එවැනි නීති 8කි. ඒවා නම්

1. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොවිය යුතුය.

Department of Examinations - Sri Lanka

2. නුඹ සඳහා නෙලූ රූපයක් හෝ ඉහළ අහසේ වත් පහල පොළොවෙහිවත් පොළවෙන් යට ජලයෙහිවත් ඇති කිසිම වස්තුවකට සමාන දෙයක් හෝ නුඹ සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකරන්න. වැඳුම් පිදුම් නොකරන්න.
3. නුඹේ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න.
4. මිනී නොමරන්න.
5. කාම මිථ්‍යාචාරය නොකරන්න.
6. සොරකම් නොකරන්න.
7. නුඹේ අසලිවැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියන්න.
8. නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ඇලුම් නොකරන්න.

3. <u>ප්‍රතිෂේධාත්මක නීති</u>

ප්‍රතිෂේධාත්මක යනු "කළ යුතුය" යන්නයි. ද්විතීය නීති සංග්‍රහයේ 5:7-21 අනුව එවැනි නීති දෙකකි.
1. දෙවි සමිඳාණන් වහන්සේ නුඹට අණ කළ පරිදි සබත් දවස ශුද්ධ ලෙස පැවැත්විය යුතුය.
2. දෙවි සමිඳාණන් වහන්සේ නුඹට අණ කළ පරිදි නුඹේ පියාටද මවටද ගෞරව කරන්න.

4. <u>සර්ව කාලීන නීති පද්ධතියකි.</u>

දස පනත අතීතයටත්, වර්තමානයටත්, අනාගතයටත් එනම් සෑම කාලයකටම ගැලපෙන නීති පද්ධතියක් වේ. එනම් සෑම පරම්පරාවකටම එය ගැලපේ.

5. <u>දෙවි -මිනිස් සහ මිනිස් - මිනිස් සබඳතාවය ගොඩනැගීමට දායක වෙයි.</u>

යහපත් ජීවිතයක් ගත කිරීමට මඟ පෙන්වීම සඳහා දෙවියන් වහන්සේ අපට දස පනත දුන් සේක. දස පනතේ පළමු පනත් තුන දෙවි සමිඳාණන් වහන්සේ හා මිනිසා අතර ඇති සබැඳියාවත් සිව්වන පනතේ සිට දසවන පනත දක්වා මිනිසා තම අසල්වැසියා සමග සබඳතා පවත්වන ආකාරයත් දක්නට ලැබේ.

(දස පනතෙහි ලක්ෂණ 5 නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 5ක් ද එම ලක්ෂණ 5 විස්තර කර ඇත්නම් ලකුණු 5 ක් ද ලබා දෙන්න)
(මෙම කොටසට මුළු ලකුණු 10යි)

(ii.)
දස පනතේ පනතක් ලෙස **"සොරකම් නොකරව"** යන පනත ගෙනහැර දැක්විය හැකිය. මෙහිදී දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන්නේ සැමවිටම අනෙකාගේ දෑ නොගනිමින්, දෙවියන් වහන්සේට ප්‍රසන්න ව දේව කැමැත්ත අනුව තමාට හිමි දේ ගැන පමණක් සිතා සාරධර්මවලින් හෙබි පුද්ගලයකු ලෙස කටයුතු කිරීමට පාසල් ශිෂ්‍යයකු ලෙස දස පනත මා හට යොදා ගත හැකිය.
දස පනතේ පනතක් වන **"මවුපියන්ට සංග්‍රහය කරව"** යන පනත අනුව අපට ආරාධනා කරන්නේ අපව මෙළොවට බිහි කළ තම මවට හා පියාට දිය යුතු නිසි ගෞරවය දෙමින් ඔවුන් තමා හදා වඩා ගැනීමේ දී දැරූ දුක් කරදර බලා ඔවුන් දෙපළට සැමවිටම ගෞරවය කිරීමට අපට ආරාධනා කරයි.

Department of Examinations - Sri Lanka

ඒ අනුව දස පනතේ මෙම පනත භාවිතා කරමින් සාරධර්මවලින් පෝෂිතය ජීවිතයක් ගත කිරීමට මා හට හැකියාව ලැබේ.

දස පනතේ පනතක් ලෙස **"මිනී නොමරව"** යන පනත පෙන්වාදිය හැකිය. එමගින් අපට දෙවියන් වහන්සේ ආරාධනා කරන්නේ සෑම මනුෂ්‍යයකුගේම ජීවිතය වටිනා බවත්, සෑම මනුෂ්‍යයෙකුම දෙවියන් වහන්සේගේ මැවිල්ලක් බවත්ය. එම නිසා මනුෂ්‍යයෙකුගේ ජීවිතය විනාශ නොකර සැමවිටම දේව ආදරය තුළ අනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීමෙන් සාරධර්ම වලින් හෙබි පුද්ගලයකු ලෙස මා හට දස පනත යොදා ගෙන කටයුතු කළ හැකිය.

දස පනතේ එක් පනතක් ලෙස **"බොරු සාක්ෂි නොකියව"** යන පනත ගෙනහැර දැක්විය හැකිය. මේ පනත මගින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන්නේ සැමවිටම සත්‍යවාදී ජීවිතයක් ගත කිරීමටත්, සෑම විටම සත්‍ය වෙනුවෙන් කතා කිරීමටත්ය. එමගින් සාරධර්මවලින් හෙබි පුද්ගලයකු ලෙස සැමවිට සත්‍යවාදීව කටයුතු කිරීමට මා හට දස පනත යොදා ගෙන කටයුතු කළ හැකිය.

දස පනතේ පනතක් ලෙස **"අන් වස්තු ආශා නොකරව"** යන පනත ගෙනහැර දැක්විය හැකිය. මෙම පනත මගින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන්නේ මා හට දෙවියන් වහන්සේ ලබා දී ඇති වස්තුවලට ආශා කරමින්, සෑම විටම දෙවියන් වහන්සේ ලබාදී ඇති තලෙන්තු අනුව කටයුතු කරමින්, ජීවිතය ඉදිරියට ගෙන යාමට ය. එමගින් අප සැමට සාරධර්මවලින් හෙබි ජීවිතයක් ගත කිරීමට දස පනත යොදා ගෙන කටයුතු කළ හැකිය.

(දස පනතේ පනත් 5 ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. ලකුණු 2x5=10)

ඉගෙනුම් ඵල :

★ ශුද්ධ වූ පාවුලු තුමාගේ ප්‍රේම පාරමිතාව අනුව ජීවිතය හැඩ ගස්වා ගෙන සහයෝගයෙන් හා ප්‍රේමයෙන් දිවි ගෙවයි.

6. (i) 1 කොරින්ති 13 පරිච්ඡේදයේ ශුද්ධ වූ පාවුලුතුමා සඳහන් කරන ප්‍රේමයේ ලක්ෂණ පහක් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) 'කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ ජීවනාලියයි.' ප්‍රේමයෙන් බැඳුණු කිතුනු පවුලක් ලෙස ශුද්ධ වූ සභාව තුළ ක්‍රියාශීලී ව කටයුතු කළ හැකි අවස්ථා පහක් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(i.)

- ප්‍රේමය ඉවසිලිවන්තය, කරුණාවන්තය.
- ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත.
- ප්‍රේමය පාරට්ටු කර ගන්නේ නැත.
- උඩගු වන්නේ නැත.
- අවිනීත නොවේ

Department of Examinations - Sri Lanka

- ආත්මාර්ථකාමී නොවේ
- හනික නොකිපේ.
- නපුර සිතේ ධාරණය කර නොගනී.
- ප්‍රේමය අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී හරිදේ ගැන ප්‍රීතිවෙයි.
- ප්‍රේමය සියල්ල උසුලයි.
- ප්‍රේමයෙහි විශ්වාසයට ඉමක් නැත, බලාපොරොත්තුවට නිමක් නැත, ඉවසීමට අගක් නැත.
- ප්‍රේමය සදාතනිකය. දිවැස්වැකි වුවද පහව යන්නේය: විවිධ ශබ්ද දෙසීම් වුවද නිම වන්නේය: ඥාණය වුවද නැති වන්නේය.

(මෙවැනි ප්‍රේමයේ ලක්ෂණ 5 සඳහන් කර කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 10 යි)

(ii.)

කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ කේන්ද්‍රය වේ. **කිතුනු පවුල් රාශියක් එක් වී ශුද්ධ වූ සභාව ගොඩනැගෙයි. ඒ අනුව දේවස්ථානය තුළ එකමුතුව සෑම පවුලක්ම කටයුතු කරන අවස්ථාවලදී,** අනෙක් පවුල්වල සාමාජික සාමාජිකාවන් පිළිගනිමින්, දේවස්ථානය තුළ වැඩ කටයුතු හා වන්දනා කටයුතු සඳහා පූජා ප්‍රසාදිතුමන්ලාට සහය වන අවස්ථාවන්වලදී සෑම කිතුනු පවුලක්ම ප්‍රේමයෙන් බැඳී ශුද්ධ වූ සභාව තුළ ක්‍රියාකාරීව කටයුතු කරයි.

කිතුනු පවුලක් ලෙස පවුලේ සාමාජික සාමාජිකාවන් එක් වී එදිනෙදා යාච්ඤා කරන අවස්ථාවන්වලදී, කිතුනු පවුල් ප්‍රේමයෙන් යුතුව ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරීත්වයට තම යාච්ඤා තුළ ක්‍රියාශීලීව දායකවන අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

කිතුනු පවුල් තුළ අඹු සැමියන් හා දූ දරුවන් තමන්ගේ **පවුල තුළ ඇති වන ප්‍රශ්නවල දී ක්‍රිස්තුස් වහන්සේ පෙන්වා දුන්නා වූ පරිත්‍යාගශීලී ප්‍රේමය මුල් කරගෙන තම ගැටලු නිරාකරණය කර ගන්නා අවස්ථා** අප හට දැක ගත හැකිය. එවැනි අවස්ථාවන්වලදී කිතුනු පවුල්වල ප්‍රේමය තුළ තම ගැටුම් නිරාකරණය කිරීම ප්‍රේමයෙන් බැඳී කිතුනු පවුල් ශුද්ධ වූ සභාව තුළ ක්‍රියාකාරීවයට කටයුතු කිරීමක් ලෙස දැක් විය හැකිය.

ශුද්ධ වූ සභාව තුළ **කිතුනු පවුල් ඒකරාශීවී පවත්වන්නාවූ විවිධ වූ ආගමික උත්සවයන් තුළදී ප්‍රේමය මුල් කරගෙන දයාවේ ක්‍රියාවන්වලට යොමුවේ. විශේෂයෙන්ම දුප්පතුන් සඳහා උදව් උපකාර කිරීම මෙහිදී දැක්විය හැකිය.** එවැනි අවස්ථාවන් වලදී කිතුනු පවුල් තම දායකත්වය ක්‍රියාශීලීව ශුද්ධ වූ සභාවට ලබා දෙන්නේ ප්‍රේමය මුල් කරගෙනය.

කිතුනු පවුල් තුළ සාමාජික සාමාජිකාවන් **එකිනෙකාට ගරු කරමින් අන් මත ඉවසමින් දේවස්ථානයේ සමිති සමාගම් තුළ ක්‍රියාකාරී වන අවස්ථාවන්වලදී** ඔවුන් සෑම කෙනෙක්ම ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරීත්වයට ප්‍රේමය මුල් කරගෙන දායක වන බව අපට කිව හැකිය.

(මෙවැනි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න ලකුණු 2x5=10)

Department of Examinations - Sri Lanka

ඉගෙනුම් ඵල :

★ **පෙන්තකෝස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය අවබෝධ කරගෙන ශුද්ධ වූ සභාවට එල්ල වන අභියෝග ජය ගැනීමට ක්‍රියා කරයි.**

7. (i) ශුද්ධාත්ම ආගමනය හා එදින සිදු වූ විශේෂ සිදුවීම් කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ඔබ, අපෝස්තුලුවරු මෙන් සමාජය තුළ දූත සේවාව ඉටු කරන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(i.)

- ජුදෙව් පෙන්තකොස්ත මංගල්‍යය සැමරීමට ජෙරුසලමට විවිධ දේශ වලින් පැමිණ සිටි ජුදෙව්වන් මවිතයට පත් කරමින් අපෝස්තුලුවරු තම තමාගේ භාෂා වලින් කතා කරනු ලැබීය. මින් පැහැදිලි වන්නේ කිතු දහම ජාතියකට හෝ දේශයකට සීමා නොවන බවයි.
- ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වූ කල පෙර තමන් සිටි බිය ඉවතලා එඩිතරව පෙන්තකොස්ත මංගල්‍යයට පැමිණෙන සියලු දෙනා ඉදිරියේ ජෙරුසලෙම් දේව මාළිගයේදී දේශනා කිරීම.
- ශුද්ධාත්ම ආගමනය ශුද්ධ වූ සභාවේ ආරම්භය ලෙසත් නව යුගයක ආරම්භය ලෙසත් ශුද්ධ වූ සභාවේ උපන්දිනය ලෙසත් සැලකේ.
- ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ පේදුරු තුමාගේ පළමු දේශනයෙන් තුන්දාහක් දෙනා ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා පසුතැවී බෞතිස්මය ලබා ගනිමින් ශුද්ධ වූ සභාවට එක්විය.
- ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වීමෙන් පසු ශුද්ධ වූ සභාව දිනෙන් දින ව්‍යාප්ත විය.

(මෙවැනි කරුණු 5ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 2x5=10 යි)

(ii.)

- තම දූත සේවාව ඉටු කිරීමට ඇප කැප වී කාලය හා ශ්‍රමය වැය කරමින් දහම් පණිවිඩය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.
- ජනතාවගේ ඇදහිල්ල වර්ධනය කිරීමට අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා වගකීමෙන් යුතුව කටයුතු කිරීම.
- තම සේවාවේදී නිර්භීතව ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරමින්, පැමිණෙන බාධක අභියෝග වලට එඩිතරව මුහුණ දී කටයුතු කිරීම.
- විශ්වාසය හීන වී ඇති අයගේ විශ්වාසය තහවුරු කර ශක්තිමත් කිරීමට සමාජය තුළ නිවැරදි නායකත්වයක් සැපයීම.
- ගැඹුරු ඇදහිල්ලෙන් හා ජීවිතාදර්ශයෙන් යුතුව සැමට එක ලෙස සහෝදරත්වයෙන් සැලකීම.
- ධර්මදූත කාර්යයන් සඳහා ගිහි නායකත්වයක් ගෙන සියලුම ජන කොටස් සමග සහයෝගයෙන් හා එකමුතුව කටයුතු කිරීම.

Department of Examinations - Sri Lanka

- සාමයේ පණිවිඩකරුවන් මෙන් නිතරම අනුන් වෙනුවෙන් පරිත්‍යාග වීමට හා එල්ල විය හැකි දුෂ්කරතා හා සිත් රිදවීම් වලදී අධෛර්යයට පත් නොවී තම කාර්යය නොපසුබට වීර්යයෙන් කිරීමට උත්සහ කිරීම.
- නිරතුරුවම දිව්‍ය සංරක්ෂණය තුළ යැපෙමින් සහෝදර ප්‍රේමයෙන් යුතුව දේව දරුවෙකු ලෙස අවගති ඉවතලා ඇතුළාන්ත පිරිසිදු බවකින් යුක්තව ශුද්ධ වූ සභා වර්ධනයට දායක වීම.

(මෙවැනි කරුණු 5ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 2x5=10 යි)

ඉගෙනුම් ඵල :

★ **පෘතුගීසීන්ගේ වූ සේවය හා විදේශීය ධර්මදූත සේවය අගය කරයි.**

8. (i) **පෘතුගීසි පාලන සමයේ දී ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු යහපත් ප්‍රතිඵල පහක් විස්තර කරන්න.** (ලකුණු 10යි)

(ii) **විදේශීය ධර්මදූත කණ්ඩායම්වලින් මෙරටට සිදු වූ සේවාවන් පහක් ලියා, අද ධර්මදූත සේවයේ නියැලෙන්නන්ට එයින් ගතහැකි ආදර්ශ පහක් පැහැදිලි කරන්න.** (ලකුණු 10යි)

(i.)

- පෘතුගිසින් ගේ පැමිණීමත් සමග හිමිවූ විශේෂතම දායාදය වූයේ කතෝලික දහමයි.
- පෙරදිග භාෂා හා අපරදිග භාෂා මෙරට ව්‍යාප්ත වීම.
- විධිමත් පාසල් අධ්‍යාපනය ලබා දීමේ ක්‍රමවේදය ආරම්භ වීම.
- පෘතුගිසි සංස්කෘතියේ ආභාසය නිසා මෙරට සංස්කෘතියට හා ජන ජීවිතයට නව අංග ලෙස පෘතුගිසි ගායනා, සංගීත, නැටුම් ආදිය (බයිලා කපිරිඤ්ඤා) එක්වීම.
- පෘතුගීසි භාෂාව ජනයා අතර ව්‍යාප්තවීම සිංහල භාෂාවේ පෝෂණයට රුකුලක් වීම උදා කොන්ත, කුරුස, සුරුවම්, කොකිස්, අල්මාරි, පෙට්ටගම්, ආරුක්කු, පාන් ආදී වචන එක්වීම.
- විවාහයේ ස්ථාවරත්වය තහවුරු කිරීම හා මෙරට පැවති එකගෙයි කෑම වැනි බහු විවාහ ක්‍රම අහෝසිවීම. එකගෙයි කෑම උඩරට විවාහ නීතියෙන් අදත් පිලිගන්නා විවාහ ක්‍රමයකි. එය තවමත් සිදුවේ.
- අධ්‍යාපනයට ආගම සම්බන්ධ කිරීම (අධ්‍යාපනයෙහි දී ආගම විෂයට අද පවා වැදගත් තැනක් හිමි වීම එහි බලපෑමකි.
- පෘතුගීසි දයා සංගමය මගින් දිළිදුන්ට, රෝගීන්ට, මහලු අයට හා අසරණයන්ට පිහිට වීමට සමාජ සේවා කටයුතු ක්‍රියාත්මක කිරීම.
- බටහිර වෛද්‍ය ක්‍රමය ආරම්භ වීම හා රෝහල් පිහිටුවීම.
- ප්‍රථම සිංහල හටන් කාව්‍ය වන 'කුස්තන්තීනු හටන' මෙම යුගයේ රචනා වීම. කර්තෘ : අලගියවන්න මුකවැටි පඬිතුමා.
- උපත් හා මරණ ලියාපදිංචි ආරම්භ වීම නිසා තෝම්බු ක්‍රමයක් බිහි වීම.

(මෙවැනි කරුණු 5ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 2 x 5= 10 යි)

Department of Examinations - Sri Lanka

(ii.)

- ධර්ම ප්‍රචාර කටයුතු සඳහා ඇප කැප වී අවංකව සේවය කිරීම.
- අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම.
- දිළිඳු දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දීමේ ක්‍රම හඳුන්වා දීම.
- ආගමික පොත පත දේශීය භාෂාවලට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට පියවර ගැනීම.
- රෝහල් සේවය සඳහා යොමුවීමෙන් ජනතාවට සේවය කිරීම.
- දේශීය පූජක පුහුණුව සඳහා දෙව්සත්හල් ආරම්භ කිරීමට පියවර ගැනීම.
- අපෝස්තලික සේවා ආරම්භ කිරීම.
- හෙළ කිතුනු සාහිත්‍යයක් හා සංගීතය ආරම්භ කිරීම.
- මහලු අසරණ වැඩිහිටියන් රැකබලා ගැනීම.
- කතෝලික පුවත්පත වන ඥානාර්ථ ප්‍රදීපය හා කැතලික් මැසෙන්ජර් ආරම්භ වීම.

<u>අද ධර්මදූත සේවය නියැලෙන්නන්ට</u>

- අල්පේච්ඡ ජීවිතයක් හා සරල ජීවිත පැවැත්මක් ඇතිව කටයුතු කිරීම.
- අසරණ දිළිඳු දරුවන්ට අධ්‍යාපනය ලබාදීම.
- සාමයේ පණිවිඩකරුවන් මෙන් නිතරම අන්‍යයන් වෙනුවෙන් පරිත්‍යාග වීමට හා කාලය ශ්‍රමය වැය කිරීමට පුරුදු පුහුණු වීම.
- නිතරම දෙවිඳුන් සමඟ සිටිමින් ශුද්ධ ලියවිල්ල තම ජීවිතයේ කොටසක් කර ගැනීම.
- තමන්ට එල්ල විය හැකි සිත් රිදීම් වලදී අධෛර්යට පත් නොවී ධෛර්යයෙන් යුක්තව තම කාර්යය නොපසුබට වීර්යයෙන් ක්‍රියා කිරීමට උත්සාහ කිරීම.
- ජාති, ආගම්, කුල, උගත්, නූගත් බේදයක් නොතකා සෑම දෙනාම එක පවුලක දූ දරුවන් ලෙස කටයුතු කිරීම.

(මෙවැනි කරුණු 5ක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 2 x 5= 10 යි)

Department of Examinations - Sri Lanka